# කම්කරු දෙපාර්තමේන්තුව

## කාර්යාල සේවක සේවයේ I, II හා III ශ්‍රේණි සඳහා වන

## පළමු, දෙවන හා තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ - 2022 අප්‍රේල්

ඉහත තනතුර සඳහා වන අංක 1777/35 හා 2012.09.27 දිනැති කාර්යාල සේවක සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව එම සේවයේ I , II හා III ශ්‍රේණි නිලධාරීන් සඳහා වන පළමු, දෙවන හා තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2022 අප්‍රේල් මාසයේ දී කම්කරු දෙපාර්තමේන්තුවේ දී පැවැත්වීමට සැලසුම් කර ඇත. මෙම පරීක්ෂණය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි.

## 01 පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා)

III වන ශ්‍රේණියට පත්වී වසර 03 ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

### 1.1 වාචික පරීක්ෂණය පිළිබඳ විස්තර

| විෂය ක්ෂේත්‍රය | ලබා දෙන ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු |
|---|---|---|---|
| I. සේවය කරන ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳ අවශ්‍ය වන දැනුම | 30 | 100 | 40 |
| II. සාමාන්‍ය කාර්යාල ක්‍රම හා ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව තම සේවයට අදාළ දැනුම | 30 | | |
| III. තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුම හා ප්‍රවීනතාවය | 40 | | |

## 02 දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා)

II වන ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වසර 03 ගතවීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

- පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ දී ආවරණය වූ විෂයයන්ට අදාළව ගත වූ සේවා කාලය තුළ අදාළ ක්ෂේත්‍රය තුළ සිදු වී ඇති පරිපාටිමය, නීතිමය සංශෝධනයන් වැනි වෙනස්වීම් පිළිබඳ සේවකයාගේ දැනුම සහ ඔහුගේ කාර්යයට අදාළ නව්‍යකරණයන් පිළිබඳ සේවකයාගේ කුසලතා මැන බැලීම සිදු කරනු ලබයි.

**2.1** වාචික පරීක්ෂණය පිළිබඳ විස්තර

| විෂය ක්ෂේත්‍රය | ලබා දෙන ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු |
|---|---|---|---|
| I. සේවය කරන ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳ අවශ්‍ය වන දැනුම | 30 | 100 | 40 |
| II. සාමාන්‍ය කාර්යාල ක්‍රම හා ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව තම සේවයට අදාළ දැනුම | 30 | | |
| III. තනතුරට පැවරෙන කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුම හා ප්‍රවීණතාවය | 40 | | |

**03** <u>**තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා)**</u>

I වන ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වසර 05 ගතවීමට පෙර තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

- පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ දී ආවරණය වූ විෂයයන්ට අදාළව ගත වූ සේවා කාලය තුළ අදාළ ක්ෂේත්‍රය තුළ සිදු වී ඇති පරිපාටිමය, නීතිමය සංශෝධනයන් වැනි වෙනස්වීම් පිළිබඳ සේවකයාගේ දැනුම සහ ඔහුගේ කාර්යට අදාළ නව්‍යකරණයන් පිළිබඳ සේවකයාගේ කුසලතා මැන බැලීම සිදු කරනු ලබයි.

**3.1** වාචික පරීක්ෂණය පිළිබඳ විස්තර

| විෂය ක්ෂේත්‍රය | ලබා දෙන ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු |
|---|---|---|---|
| I. සේවය කරන ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳ අවශ්‍ය වන දැනුම | 30 | 100 | 40 |
| II. සාමාන්‍ය කාර්යාල ක්‍රම හා ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව තම සේවයට අදාළ දැනුම | 30 | | |
| III. තනතුරට පැවරෙන කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුම හා ප්‍රවීණතාවය | 40 | | |

**04. අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

මෙම පරීක්ෂණ සඳහා පෙනී සිටීමට බලාපොරොත්තු වන අපේක්ෂයින් මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව A4 කඩදාසියක සකසා ගත් අයදුම්පත් අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය සහිතව **<u>2022 අප්‍රේල් මස 08 දින හෝ ඊට පුථම</u>** කම්කරු කොමසාරිස් (පාලන), කම්කරු දෙපාර්තමේන්තුව, තැ.පෙ. 575, කොළඹ 05 ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ **<u>කාර්යාල සේවක සේවයේ I , II හා III ශ්‍රේණි සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ - 2022 "</u>** යනුවෙන් සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**05. විභාගයට පෙනී සිටීමට සුදුසුකම් :**

මෙම නිවේදනය සැලකිල්ලෙන් කියවා ඉල්ලා ඇති සියලුම තොරතුරු සම්පූර්ණ කර, අයදුම්පත් නියමිත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතුය. මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් වෙතොත් ඒවා ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

**06. පරීක්ෂණය පැවැත්වීම :**

අයදුම්පත් ඉදිරිපත් කර ඇති සුදුසුකම් සපුරා තිබෙන සියලුම අයදුම්කරුවන් වෙත වාචික පරීක්ෂණය පවත්වන දිනය හා වේලාව දන්වා එවනු ලැබේ.

**07.** විභාගයට පෙනී සිටීම සඳහා පැමිණීම වෙනුවෙන් ගමන් වියදම්, සංයුක්ත දීමනා හෝ උපවේශන දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

**එච්.ටී.පී. අබයරත්න**
කම්කරු කොමසාරිස් (පාලන)

**අත්/කළේ: බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති**
කම්කරු කොමසාරිස් ජනරාල්

දිනය: 2022.03.18

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**කම්කරු දෙපාර්තමේන්තුව**

**<u>කාර්යාල සේවක සේවයේ I , II හා III ශ්‍රේණි වල සේවක මහත්ම/ මහත්මීන් සඳහා වන</u>**

**<u>පළමු, දෙවන හා තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ - 2022</u>**

01. 1.1 අයදුම්කරුගේ මුලකරු සමග නම : (සිංහලෙන්) ..............................................................

.......................................................................................................

1.2 සම්පූර්ණ නම : (සිංහලෙන්) .......................................................................

.......................................................................................................

02. 2.1 තනතුර හා ශ්‍රේණිය ..............................................................................

2.2 (අ) III ශ්‍රේණියට පත්වූ දිනය : ................................................

(ආ) II ශ්‍රේණියට උසස් වූ දිනය : ..............................................

(ඇ) I ශ්‍රේණියට උසස් වූ දිනය : ................................................

(අදාළ ශ්‍රේණිය පමණක් සම්පූර්ණ කරන්න)

03 3.1 රාජකාරී ස්ථානය හා එහි ලිපිනය: .......................................................

.......................................................................................................

3.2 දුරකථන අංක : රාජකාරී : [ ] පුද්ගලික : [ ]

04. 4.1 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

4.2 උපන් දිනය : [ ][ ][ ][ ] [ ][ ] [ ][ ]

4.3 ස්ත්‍රී පුරුෂ භාවය : [ ]

05. 5.1 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]

5.2 පෙනී සිටීමට බලාපොරොත්තු වන විභාගය : [ ]

06. අයදුම්කරුගේ ප්‍රකාශය :

(අ) මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

(ආ) මෙම විභාගයට අදාළ සියලුම කොන්දේසි පිළිපැදීමට මම එකඟ වෙමි.

දිනය :

අයදුම්කරුගේ/කාරියගේ අත්සන

07. **කාර්යාල/අංශ ප්‍රධානියාගේ නිර්දේශය :**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ඉහත අත්සන යෙදූ නිලධාරියා/නිලධාරිනිය මෙම කාර්යාලයේ/අංශයේ සේවය කරන බව සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය : කාර්යාල/අංශ ප්‍රධානියාගේ අත්සන
නිල මුද්‍රාව

08. **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,

(ii) අපේක්ෂකයා/ අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

දිනය: දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන